# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය / த. பெ.இ 2171635 / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1724 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 18/11/2024 පැය 1005

**මාධ්‍ය නිවේදනය**

### 01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පැලියගොඩ පොලිස් ස්ථානය.

2024.11.17 වන දින රාත්‍රී කාලයේ පැලියගොඩ පොලිස් වසමේ වනවාසල ප්‍රදේශයේදී පැලියගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 600 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වන කැලණිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පැලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ඇහැලියගොඩ පොලිස් ස්ථානය.

2024.11.17 වන දින උදෑසන කාලයේ ඇහැලියගොඩ පොලිස් වසමේ මින්නාන ප්‍රදේශයේදී ඇහැලියගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීතිවිරෝධී මත්පැන් ලීටර් 75ක් සන්තකයේ තබා ගෙන ත්‍රීරෝද රථයකින්** ගමන් කරමින් සිටි සැකකරුවෙකු ත්‍රීරෝද රථය සමග අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වන අවිස්සාවේල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඇහැලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොතුවිල් පොලිස් ස්ථානය.

2024.11.17 වන දින අළුයම් කාලයේ පොතුවිල් පොලිස් වසමේ හුලන්නුගේ ප්‍රදේශයේදී පොතුවිල් පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වන සියඹලාආණ්ඩුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොතුවිල් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**